# බ්‍රිතාන්‍යය : යුද්ධයට බර 'මැදුම් පිළිවෙත'

එක්දහස් නවසිය අසූ පහේ මාර්තු මාසයේ 06 වෙනිදා නිකරාගුවාවේ මනගුවා අගනුවර හමුදා මූලස්ථාන සංකීර්ණය භූමි කම්පාවක් බඳු බිහිසුණු පිපිරුම් වැළකින් දෙදරා ගියේය. නිකරාගුවානු මිලිටරි යන්ත්‍රයේ හදවතටම එල්ල කළ ප්‍රහාරය බැලූ බැල්මට සැළසුම් කොට තිබුණේ විප්ලවකාරී සැන්ඩිනිස්ටා ආණ්ඩුව බිඳ දැමීමට සටන් කළ දක්ෂිණාංශික 'කොන්ට්‍රා' කැරලිකරුවන් විසිනි. නමුත් එයින් දෙවසරක් ඇවෑමෙන්, 1987 ජූලි මාසයේදී එක්සත් ජනපදයේ ඒකාබද්ධ කොන්ග්‍රස් කමිටුවක් හමුවේ සාක්ෂි දීමට කැඳවන ලද රේගන්ගේ රිපබ්ලිකන් පාලන තන්ත්‍රය යටතේ වූ ජාතික ආරක්ෂක කවුන්සිලයේ දේශපාලන-මිලිටරි කටයුතු පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ලුතිනන් කර්නල් ඔලිවර් නෝර්ත් විසින් වැදගත් රහසක් හෙළිදරව් කළේය. රේගන් ආණ්ඩුව යටතේ සිදු කළ කුප්‍රකට 'ඉරාන-කොන්ට්‍රා අවි ගණුදෙනුව' පිළිබඳ විමර්ශණය සඳහා පිහිටුවන ලද යට කී කොන්ග්‍රස් කමිටුව හමුවේ නෝර්ත් විසින් දෙන ලද සාක්ෂි අනුව, පැනමා ජාතික තාක්ෂණඥයින් දෙදෙනෙකු සමග මනගුවා ප්‍රහාරය සැළසුම් කරන ලද්දේ බ්‍රිතාන්‍යයේ විශේෂ ගුවන් සේවා බලකායේ *(SAS - Special Air Service)* හිටපු මේජර්වරයෙක් වූ ඩේවිඩ් වෝකර් විසිනි. බ්‍රිතාන්‍යයේ 22 වෙනි ගුවන් සේවා රෙජිමේන්තුවේ හෙවත් විශේෂ ගුවන් සේවා බලකායේ අණදෙන නිළධාරියෙකු වශයෙන් උතුරු අයර්ලන්තයේත්, දකුණු ඇමරිකාවේත් සේවය කළ මේජර් වෝකර් 1970දී ක්‍රියාන්විත සේවයෙන් ඉවත් වී පෞද්ගලික ආරක්ෂක සමාගම් ක්ෂෙත්‍රයට අවතීර්ණ වූවෙකි. මුලින් *Control Risks* නමැති පළමු පෙළේ බ්‍රිතාන්‍ය ආරක්ෂක සමාගමකට සම්බන්ධ වී ක්‍රියාකළ ඔහු වඩා උනන්දුවක් පෙන්නුම් කළේ එහිම කුඩා අනු සමාගමක් කෙරෙහි ය. 1977 දී එම කුඩා සමාගම මිලට ගනිමින් ආරක්ෂක සමාගම් ක්ෂෙත්‍රය තුළට තනිව ප්‍රවිෂ්ඨ වූ වෝකර්, කලින් විශේෂ ගුවන් සේවා බලකායේ ක්‍රියා කොට ඉන් ඉවත් වූ පළපුරුදු පිරිස් බොහෝ දෙනෙකු මෙම සමාගමට සම්බන්ධ කොට ගත්තේය. එතැන් සිට එළඹි දශකය තුළ ලොව පුරා දක්ෂිණාංශික පාලන තන්ත්‍රයන් හා බලවේගයන්ට අවශ්‍ය පරිදි යුද විශේෂඥ ඥාණය සැපයීමටද, නිකරාගුවාවේ සිදු කළ ආකාරයේ රහස් ප්‍රහාරයන්ටද මුල් වූ 'කීනි මීනි සර්විසස්' නමින් කුප්‍රකට වූයේ මේජර් වෝකර්ගේ මෙම සමාගමයි.

1983 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායට මෙන්ම, 1985 දී ශ්‍රී ලංකා යුද හමුදාවේ කොමාන්ඩෝ රෙජිමේන්තුවේ 'බී' කණ්ඩායමටද අවශ්‍ය ප්‍රති-කැරළි යුදක්‍රියා *(counter-insurgency warfare)* පිළිබඳ මූලික පුහුණුවීම් සපයන ලද්දේ මේජර් වෝකර්ගේ මෙම කුප්‍රකට ආරක්ෂක සමාගම විසිනි *(Elite Series 41 : Elite Forces of India & Pakistan - Ken Conboy / Paul Hannon)*. ඒ වනාහී ඊශ්‍රායෙල් ෂින්බෙත් අභ්‍යන්තර අරක්ෂක ඒකකය සහ බ්‍රිතාන්‍ය විශේෂ ගුවන් සේවා ඒකකය විසින් නිල වශයෙන් සපයන ලද පුහුණු සේවාවන්ට අමතර වශයෙනි. 1987 වන විටත් 'කීනි මීනි ආරක්ෂක සමාගමෙ'ට අනුයුක්තව ක්‍රියාකළ බ්‍රිතාන්‍ය විශේෂ ගුවන් සේවා බලකායේ හිටපු සංග්‍රාමික විශේෂඥයින් අඩුම වශයෙන් 35 දෙනෙකුවත් ඊළම් යුද්ධය සඳහා රජයේ ආරක්ෂක අංශයන්ට අවශ්‍ය පුහුණුවීම් සහ ක්‍රියාන්විත දායකත්වය නේවාසික පදනමින්ම සම්පාදනය කරමින් සිටි අතර ශ්‍රී ලංකා ගුවන් හමුදා නියමුවන්ට බෙල් 212 සහ 412 ප්‍රහාරක හෙලිකොප්ටර් යානා මගින් ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව යුදබිමේදීම සපයමින් සිටියහ. බ්‍රිතාන්‍යයේ වැනල් දූපත්හි පදනම් වූ වෝකර්ගේ කුලී ආරක්ෂක සමාගම හා ශ්‍රී ලංකා රජය අතර පවතින ගිවිසුම මුළුමණින්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ සම්බන්ධයකින් තොර එකකැයි කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය මෙන්ම බ්‍රිතාන්‍ය රජයද තරයේ කීහ. 1986දී පැවැති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ 42වෙනි සමුළුවාරය ඇමතූ බ්‍රිතාන්‍ය රජයේ නියෝජිතයා ශ්‍රී ලංකාවේ යුද්ධය පිළිබඳ අදහස් පළකරමින් ''ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ආතතීන්ට මිලිටරිමය විසඳුමක් වෙනුවට දේශපාලන විසඳුමක අවශ්‍යතාව බ්‍රිතාන්‍ය රජය විසින් අඛණ්ඩව අවධාරණය කොට ඇතැයි'' කියා සිටියේය. නමුත් වඩාත් වැදගත් හෙළිදරව්ව කරන ලද්දේ 'වොෂින්ටන් ටෛම්ස්' පත්‍රයේ වාර්තාකරුවෙකු විසිනි. අදාළ වාර්තාවට අනුව 1987 මැයි මාසයේ කටුකුරුන්දේදී 'කීනි මීනි සර්විසස්' කුලී හේවා විශේෂඥ කණ්ඩායමේ අණදෙන නිළධාරි කෙන් වයිට් 'වොෂින්ටන් ටෛම්ස්' වාර්තාකරුට මෙසේ කියා තිබිණ: ''අපි ශ්‍රී ලංකා රජයේ සේවකයින් වෙමු. එහෙයින් ජාතික ආරක්ෂක ඇමතිවරයා සහ කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට අපි ගැන කියන්නට ඇති දේ විමසා බලන්නැයි මම ඔබෙන් ඉල්ලමි. ඊට වැඩි යමක් කියන්නට මට නොහැක.'' *(The Washington Times / 19 May 1987)*

### බ්‍රිතාන්‍යය සහ ඊළම් යුද්ධය : වර්තමාන කතාව

අතීතය තුළ වැළලී යමින් තිබෙන මේජර් වෝකර් ප්‍රමුඛ බ්‍රිතාන්‍ය විශේෂ ගුවන් සේවා බලකායේ භූමිකාව, ඊළම් යුද්ධයේ ආරම්භයේ සිටම බ්‍රිතාන්‍ය රජයේ පිළිවෙත කුමක් වී දැයි හකුළා දක්වන වැදගත් නිදසුනකි. විවෘත තලයේ එය හැමවිටම 'මානව හිමිකම් සහ සුළුතර අයිතිවාසිකම්' ආරක්ෂා කිරීමේත්, යුදමය ක්‍රියාමාර්ග වෙනුවට 'දේශපාලන විසඳුමක් සඳහා ප්‍රයත්න දැරීමේ'ත් වැදගත්කම රාජ්‍ය තාන්ත්‍රික භාෂාවෙන් අවධාරණය කරන්නක් විය. නමුත් ආවෘත තලයේදී එය ශ්‍රී ලංකා රජයේ යුද හස්තය සවිමත් කිරීම වෙනුවෙන් කළ හැකි බොහෝ දේ නොමසුරුව ඉටු කරන ලද පිළිවෙතකි. අතීතයේ සිට පැවැත එන මේ දෙයාකාර ප්‍රවේශය සිව්වෙනි ඊළම් යුද්ධය දක්වාම මනා සේ ආරක්ෂා කෙරෙමින් පවතී. එකක් හොඳින් පෙනේ. අනෙක සැඟව තිබේ.

මහින්ද රාජපක්ෂ පාලනය ආරම්භ වී හාර මාසයක් ඇවෑමෙන් නව රජයේ විදේශ අමාත්‍ය මංගල සමරවීර යුරෝපා සංචාරයක අතරවාරයේ බ්‍රිතාන්‍යයට ගොඩ බැස්සේය. බ්‍රිතාන්‍ය විදේශ ලේකම් ජැක් ස්ට්‍රෝ හමු වී කළ නිල සාකච්ඡාවන් තුළ කුමක් සාකච්ඡා විණිදැයි සවිස්තරාත්මකව අනාවරණය නොවිණ. නමුත් දෙමළ විමුක්ති කොටි සංවිධානය යුරෝපා සංගමය තුළ තහනම් සංවිධාන ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා බ්‍රිතාන්‍යයේ ක්‍රියාකාරී භූමිකාව ශ්‍රී ලංකාව අපේක්ෂා කළ බවට සැක නැත. සංචාරයෙන් දෙමසක් ඇතුළත දී අපේක්ෂාව යථාර්ථයක් බවට පත් කරමින් කොටි සංවිධානය යුරෝපා සංගමය තුළ තහනමට ලක් කෙරුණු අතර තීරණය සඳහා යුරෝපා සංගමය පෙළඹවීමට අවශ්‍ය තීරණාත්මක වැඩ කොටසක් එක්සත් ජනපදය බැහැරින්ද, බ්‍රිතාන්‍යය අභ්‍යන්තරයෙන්ද ඉටු කළ බව දැන් නොරහසකි. ඉන් වසරක් ඇවෑමෙන් 2007 පෙබරවාරි 13 වෙනිදා බ්‍රිතාන්‍ය විදේශ සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කටයුතු පිළිබඳ ලේකම් කිම් හොවෙල්ස් කොළඹට ළඟා විය. සංචාරය ආරම්භ කිරීමට පෙර පෙබරවාරි 12 වෙනිදා ලංකාව පිළිබඳ ලිපියක් ලියමින් ආචාර්ය හොවෙල්ස් මෙසේ ලීවේය: ''ශ්‍රී ලංකාවේ ගැටුමට සාමකාමී විසඳුමක් සොයාගැනීමට හැකිවිය යුතුය යන්න හැරෙන්නට ශ්‍රී ලංකාව කෙරෙහි වූ අන් කිසිදු ප්‍රාර්ථනාවක් අද බ්‍රිතාන්‍ය ආණ්ඩුවට නොමැත....ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බ්‍රිතාන්‍ය දේශපාලන සහ සංවර්ධන ප්‍රයත්නයන්ට ඇත්තේ එක් අරමුණකි.

එනම් තිරසාර සාමයක් අත්පත් කරගැනීමට ඉවහල් වන තත්ත්වයන් නිර්මාණය කිරීමට උපකාර කිරීමයි.'' ලේබර් පක්ෂ ආණ්ඩුවේ කිම් හොවෙල්ගේ ප්‍රකාශය, 1986 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම අමතා කතා කළ බ්‍රිතාන්‍ය කොන්සර්වේටිව් පක්ෂ ආණ්ඩුවේ නියෝජිතයාගේ ප්‍රකාශය යළිත් සිහිගන්වන සුලු එකකි.

නමුත් ඊළම් යුද්ධය ඇවිළ ආ '80 දශකයට සාපේක්ෂව ශ්‍රී ලංකා රජයේ යුදමය ශක්තිය ප්‍රවර්ධනය සඳහා බ්‍රිතාන්‍ය දායකත්වය අඩුවීමකට වඩා වැඩිවීමක් පෙන්නුම් කොට තිබේ. නිදසුනක් ලෙස තුන්වෙනි ඊළම් යුද්ධයේ තීරණාත්මක වසරක් වූ 2001 වසරේදී බ්‍රිතාන්‍ය අවි තැරැව්කරුවන් විසින් ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට වායු ඉන්ධන පිපිරුම් ශීර්ෂ *(fuel air warheads)* සහිත රොකට් අලෙවි කළ බවට බ්‍රිතාන්‍යයේ ගවේෂණාත්මක පත්‍ර කලාවේදීන් දෙදෙනෙකු විසින් හෙළිදරව් කරන ලදී. 2001 නොවැම්බර් 23 වෙනිදා ලන්ඩනයේ 'ගාඩියන්' පුවත්පතේ පළ වූ එම වාර්තාවට අනුව, ප්‍රහාරයට ලක්වන අයගේ ඇස් සහ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් පුපුරුවා මරණයට පත් කරන මෙකී මාරක පිපිරුම් ශීර්ෂ සහිත රොකට් 1,000ක් එම අවුරුද්දේ ජූනි මාසයේදී බ්‍රිතාන්‍යයේ සීමාසහිත ග්ලැඩ්ස්ටන් ඉන්ඩස්ට්‍රියල් හෝල්ඩින්ග්ස් (පසුව ව්‍යාජ නාමයක් බවට හෙළිදරව් වූ) සමාගම විසින් ශ්‍රී ලංකාවට නැව්ගත කොට තිබේ. ඩොලර් මිලියන 3.6ක වටිනාකමක් සහිත මෙම ගණුදෙනුවට අදාළ ගෙවීම් සිදුකොට තිබුණේ ලන්ඩනයේ ලංකා බැංකු ශාඛාව හරහා ය. *(UK Dealers sell 'Vaccum Bombs' to Sri Lanka - The Guardian / 23.11.2001)*

**බ්‍රිතාන්‍ය අවි අපනයන පිළිවෙත**

'80 දශකයේදී බ්‍රිතාන්‍ය අවි තැරැව්කරුවන් හා පෞද්ගලික ආරක්ෂක සමාගම් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග ඇතිකරගත් ගිවිසුම් අරභයා බ්‍රිතාන්‍ය රජයේ වගකීමක් නොමැති බව ඒත්තු ගැන්වීම සාමාන්‍යයෙන් බ්‍රිතාන්‍යයේ නිල පිළිවෙත විය. නමුත් එම අවධියේ පවා ආරක්ෂක ක්ෂේත්‍රය තුළ සිදුවන කවර ආකාරයේ හෝ භාණ්ඩ හා සේවා අපනයනයන් සඳහා බ්‍රිතාන්‍ය වෙළඳ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අපනයන බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය විය. මෙකී බලපත්‍රයක් දොළොස් මසක කාලයක් සඳහා වලංගු වේ. ඊට අමතරව රජයට සම්බන්ධ ආරක්ෂක කර්මාන්තායතන මගින් සිදු කෙරෙන අපනයනයන්ට අදාළ ඇණවුම් සියල්ල විදේශ සහ පොදු රාජ්‍ය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේද, ආරක්ෂක අමාත්‍යාංශයේද, භාණ්ඩාගාරයේ හා කර්මාන්ත දෙපාර්තමේන්තුවේද අධීක්ෂණයට යටත්ව සිදු කෙරීම සාමාන්‍ය පටිපාටිය විය. *(Militarisation in Sri Lanka - Mayan Vije)*

නමුත් ඉහත පටිපාටිය මෑතදී තවදුරටත් විධිමත්ව තිබේ. ඉරාකයට අවි සැපයීම පිළිබඳ මතභේදාත්මක හෙළදරව් වීම් හමුවේ 1996 පෙබරවාරියේදී එළිදුටු 'ස්කොට් වාර්තාව' විසින් ඇති කළ බලපෑම් හේතුවෙන් ආරක්ෂක ක්ෂේත්‍රය හා සම්බන්ධ අපනයනයන්ට අදාළ නීතිමය විධිවිධාන දැඩි කිරීමට බ්‍රිතාන්‍ය රජයට සිදුවිය. මේ අනුව ඒ සඳහා මූලික පදනම සැපයූ හරිත පත්‍රිකාව 1996 ජූලි මාසයේදීත්, ඒ පිළිබඳවම වූ ධවල පත්‍රිකාව 1998 ජූලි මාසයේදීත් සම්පාදනය කරන ලද අතර ඒ මත පදනම් වූ අපනයන පාලන පනතට *(Export Control Act)* අදාළ මූලික කෙටුම්පත සැකසීම 2001 මාර්තුවේදී සම්පූර්ණ කරන ලදී. ඒ අවුරුද්දේම ජූනි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද පනතේ අවසාන කෙටුම්පත පාර්ලිමේන්තු එකඟතාව ලැබීමෙන් පසු 2002 ජූලි මාසයේදී රාජකීය අනුමැතිය සහිතව බලාත්මක කෙරිණ. නව පනත කෙතරම් දැඩි එකක් වීද යත්, බ්‍රිතාන්‍යය තුළ හෝ වෙනත් රටක පදනම් වූ බ්‍රිතාන්‍ය පුරවැසියෙකුගේ අතරමැදිකාරත්වයෙන් බ්‍රිතාන්‍යයෙන් බැහැර වූ රාජ්‍ය දෙකක් අතර සිදුකරනු ලබන අවි හෝ තාක්ෂණ හුවමාරු ගණුදෙනුවක් සම්බන්ධයෙන් පවා පනතෙහි එන අපනයන වෙළඳ පාලන විධි විධානයන් බලපවත්වයි. *(Export Control Act 2002 - Chapter 28 / Trade Controls - 4:1 to 4:8)* මේ යටතේ ආරක්ෂක ක්ෂේත්‍රයේ සියළු අපනයනයන් පිළිබඳ අධීක්ෂණ බලය අපනයන පාලන සංවිධානය *(Export Control Organisation - ECO)* සතුවන අතර අදාළ බලපත් නිකුත්කිරීමේ සහ ඊට අදාළ නිර්ණායක තීරණය කිරීමේ බලය එය විසින් හොබවනු ලබයි. ඇතැම්විට නීරස විය හැකි වුවද මේ සියළු කරුණු වැදගත්වන්නේ බ්‍රිතාන්‍ය මූලික කොටගෙන සිදුවන කවර හෝ ආරක්ෂණ සැපයුමක් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය රජය සතු පැහැදිලි වගකීම වටහා ගැනීමට ය.

**මානව හිමිකම් සඳහා යුද ආධාර**

සෘජු අවි සම්බාධක බලපවත්වන රාජ්‍යයන් 17ක් මූලික වශයෙන් බ්‍රිතාන්‍යය විසින් ලැයිස්තුගත කර තිබේ. මෙය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ සහ යුරෝපා සංගමයේ සම්බාධක බලපවත්වන රාජ්‍යයන්ගේ ලැයිස්තුන්ට අනුගත වේ. 'යුදමය ක්‍රියාමාර්ග' සහ 'දේශපාලන විසඳුම්' පිළිබඳ බ්‍රිතාන්‍යයේ වාචික ස්ථාවරයන් කුමක් වුවද ශ්‍රී ලංකාව අරභයා මේ කිසිදු සම්බාධක ප්‍රතිපත්තියක් බලපවත්වනු නොලබයි. සටන් විරාම ගිවිසුම අත්සන් කොට වසරක් ඇවෑමෙන් 2003 වසරේදී ශ්‍රී ලංකා නාවුක හමුදාවට අයත් අධිවේගී ප්‍රහාරක යාත්‍රා 15ක ප්‍රහාරක බලය වර්ධනය කිරීම සඳහා වූ ඩොලර් මිලියන 10.8ක සැපයුම් කොන්ත්‍රාත්තුව ඊශ්‍රායෙලයේ රෆායෙල් අවි සංවර්ධන අධිකාරිය විසින් හිමි කරගන්නා ලද අතර අදාළ සැපයුම්කාර සමාගම වූයේ බ්‍රිතාන්‍යයේ සීමාසහිත එස්.ජී.ඊ. සමාගමයි. අදාළ අවි ගණුදෙනුවේ අතරමැදි භූමිකාව විවෘතවම ඉටු කරන ලද්දේ කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසිනි. *(UK backed Israeli deal to enhance Lanka's firepower - The Island / 13.12.2006)*

මානව හිමිකම් පිළිබඳ වාචික අවධාරණයන් පසෙක තිබියදී, සිව්වෙනි ඊළම් යුද්ධයේ ආරම්භයෙන් පසුව පවා බ්‍රිතාන්‍ය අවි සැපයුම්කාර භූමිකාවේ වෙනසක් සිදුවූ බවක් පෙනෙන්නට නොවීය. ස්ලොවැකියානු පුවත්පතකට ටොම් නිකොල්සන් විසින් සපයන ලද වාර්තාවකට අනුව, 2005 සහ 2006 වර්ෂ තුළ දී බ්‍රිතාන්‍යය විසින් යුරෝ මිලියන 8.5ක් වටිනා ආරක්ෂක සැපයුම් ශ්‍රී ලංකාවට සපයා තිබේ. *(Slovakia sells missiles to Sri Lanka in breach of EU export rules - BBC Monitoring / 08.04.2008)* බ්‍රිතාන්‍ය රජයේ අවි අපනයනයන් පිළිබඳ වාර්ෂික නිල වාර්තාවන්ම පවා මීට දෙස් දෙයි. එක්සත් රාජධානියේ උපායික අපනයන පිළිබඳ 2006 වාර්ෂික වාර්තාවෙන් හෙළිවන පරිදි එම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව සඳහා බ්‍රිතාන්‍ය අපනයන පාලන සංවිධානය මගින් ප්‍රමිත කේවල අපනයන බලපත් *(Standard Individual Export Licence - SIEL)* 22ක්ද, විවෘත කේවල අපනයන බලපත් *(Open Individual Export Licence - OIEL)* 9ක්ද අනුමත කරනු ලැබ තිබේ. ඒ අනුව 2006 වසර සඳහා ස්ටර්ලින් පවුම් 816,638ක් වටිනා ආරක්ෂක උපකරණ සහ අවි බ්‍රිතාන්‍යය විසින් ශ්‍රී ලංකාවට සපයා තිබේ. *(United Kingdom Strategic Export Controls - Annual Report 2006)* 2008 වසරේ ජූලි මාසයේදී නිකුත් කරන ලද 2007 වසර සඳහා වූ බ්‍රිතාන්‍ය උපායික අපනයයන් පිළිබඳ වාර්තාවට අනුව 2007 සඳහා විවෘත කේවල අපනයන බලපත් *(SIEL)* 21 ශ්‍රී ලංකාව සඳහා අනුමත කොට තිබේ. ඒ අනුව 2007 වසරේ ශ්‍රී ලංකාවට අනුමත කරන ලද බ්‍රිතාන්‍ය ආරක්ෂක උපකරණ හා අවි සැපයීම්වල වටිනාකම ස්ටර්ලින් පවුම් මිලියනයකි. ඕනෑ නම් මෙය ගැටුම් පවතින අවශේෂ රටවලට එම කාලය තුළදීම බ්‍රිතාන්‍යය විසින් කරන ලද සැපයුම් හා

සසඳා බැලිය හැකිය. ඒ අනුව යේමනයට ස්ටර්ලින් පවුම් මිලියන 0.2කි. නේපාලයට මිලියන 0.1කි. කොලොම්බියාවට මිලියන 0.4කි. පිලිපීනයට මිලියන 0.2කි. *(United Kingdom Strategic Export Controls - Annual Report 2007)*

නිල වාර්තාවන් මෙබඳු වුවද 2007 මැයි 02 වෙනිදා ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ පැවැති විවාදයේදී පාලක ලේබර් පක්ෂයේ මන්ත්‍රිනී ජෝආන් රුඩොක් විසින් හෙළිදරව් කරන ලද ආකාරයට 2007 වසරේ පමණක් ශ්‍රී ලංකාව සඳහා අනුමත කරන ලද අවි සැපයුම් බලපත්වල ඒකාබද්ධ වටිනාකම ස්ටර්ලින් පවුම් මිලියන 7කි. මෙය ඇත්ත වශයෙන්ම 2004 සුනාමි ව්‍යසනයෙන් පසු බ්‍රිතාන්‍යය විසින් ශ්‍රී ලංකාවට ලබාදීමට එකඟ වූ මානුෂීය ආධාරයන්ගේ ඒකාබද්ධ වටිනාකමට දළ වශයෙන් සම වේ. *(UK arms sales to Sri Lanka match Tsunami Aid - Tamilnet / 03.05.2007)* හරියටම ඉහත හෙළිදරව්වෙන් දවසකට පසු '**ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ අසතුටුදායක තත්ත්වය සැළකිල්ලට ගැනීමක් වශයෙන් ශ්‍රී ලංකාව සඳහා ලබාදීමට නියමිත වාර්ෂික සංවර්ධන ආධාරවලින් හරි අඩක් (පවුම් මිලියන 3ක්) අත්හිටුවන බව**' බ්‍රිතාන්‍ය රජය නිවේදනය කර සිටියේය.

සිව්වෙනි ඊළම් යුද්ධය 'අනන්ත බටහිර බාධාවන් මධ්‍යයේ අපේ හයියෙන් කරගෙන යන ව්‍යායාමයකැ'යි බහුලව පැතිර පවතින විශ්වාසයන්ට පරස්පර මේ යථාර්ථයන් අදටත් දකුණේ බහුතර ජනයා නොදනිති. නමුත් 'මෙවර බැරි නම් කිසි කලෙකත් මේ යුද්ධය දිනන්නට බැරි'බව නාවික හමුදාපතිවරයා සැප්තැම්බර් 04 වෙනිදා 'ඩේලි නිවුස්' පත්‍රයට කළ ප්‍රකාශය ඇතැම් විට මේ යථාර්ථයන් ගැන දැනුවත් බැවින් කළ ප්‍රකාශයක් වීමටද ඉඩ තිබේ.

**අවි අපනයනයේ යුරෝපීය සීමා(?)**

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන බ්‍රිතාන්‍ය ආරක්ෂණ සැපයුම් පිළිවෙත විසින් උල්ලංඝණය කරනු ලබන්නේ හුදෙක් බ්‍රිතාන්‍ය විසින්ම කලින් කලට මානව හිමිකම් හා දේශපාලන විසඳුම් සම්බන්ධයෙන් කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික ප්‍රකාශ පමණක් නොවේ. වඩා පළල් සන්දර්භයක් තුළදී එය යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍ය 25ක් විසින් පිළිගනු ලැබ ඇති අවි අපනයනයේදී සාමූහිකව පිළිපැදිය යුතු මූලික ප්‍රතිපත්ති රාමුවටද පටහැනිව යන්නේ යැයි යමෙකුට අවශ්‍ය නම් තර්ක කළ හැකිය.

යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයන් විසින් කරනු ලබන අවි අපනයනයන්ට අදාළව, පොදු නිර්ණායකයන් ඇති කරගැනීමට මූලික එකඟතාව නිර්මාණය වූයේ 1991දීත්, 1993දීත් පැවැති ලක්සම්බර්ග් හා ලිස්බන් යුරෝපා සභාවන්හි දීය. ඒ අනුව 1998 ජූනි 05 වෙනිදා බ්‍රසල්ස් නුවරදී සම්මත කරගත් අවි අපනයනය පිළිබඳ යුරෝපා සංගමයේ ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ ලියැවිල්ලෙහි අවි අපනයනයේදී සැළකිල්ලට ගත යුතු මූලික නිර්ණායක 08ක් දක්වා තිබේ. ඉන් දෙවෙනි නිර්ණායකය වන්නේ 'අවි ගැණුම්කාර රාජ්‍යය මානව හිමිකම් කෙරෙහි දක්වන පිළිගැනීමයි'. තුන්වෙනි නිර්ණායකය වන්නේ 'අදාළ අවි සැපයුම්, අවි ගැණුම්කාර රාජ්‍ය තුළ දැනටමත් පවතින ගැටුම් දිග්ගැස්වීමට හෝ නව ගැටුම් කුළුගැන්වීමට හේතු කාරක නොවීමයි.' *(European Union Code of Conduct on Arms Export / 3-4 පිටු)* ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයන් විසින් කරනු ලබන අවි හා ආරක්ෂක උපකරණ සැපයුම් මෙකී දෙවෙනි හා තුන්වෙනි නිර්ණායකවලට සපුරාම පටහැනිව යන බවට අවශ්‍ය නම් තර්ක කළ හැකිය. නමුත් නිල අවි සම්බාධක පනවනු නොලබන තෙක් පාර්ලිමේන්තු තුළ හෝ ජනමාධ්‍ය හමුවේ කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික තරවටු කිරීම් ඇත්ත වශයෙන්ම යුද්ධයට ප්‍රායෝගික තලයේ බාධා නිර්මාණය නොකරයි. එවැනි ප්‍රකාශ යනු හුදෙක් මේ ඕනෑම රටක විදේශ පිළිවෙත සඳහා අත්‍යවශ්‍ය 'නිර්පාක්ෂික සමතුලිතභාවය' ප්‍රදර්ශනය කෙරෙන බාහිර ආයිත්තමක් පමණි.

නමුත් බ්‍රිතාන්‍ය නිදසුන පසෙකින් තැබුවද, යුරෝපා සංගමයේ සාමාජිකත්වය හොබවන වෙනත් රාජ්‍යයන්ද ඕනෑ තරම් ශ්‍රී ලංකා රජයේ යුදමය හස්තය ශක්තිමත් කිරීමට අවහිර-බාධාවන්ගෙන් තොරව සම්මාදම් වී තිබේ. යුරෝපයේ භූමිකාව තවදුරටත් විමසා බැලීම වැදගත් වන්නේ ඒ නිසාය.

**(මතු සම්බන්ධයි)**

**රවීස**
*raveesa@googlemail.com*

*රාවය / 2008 ඔක්තෝබර් 12*